# SRI LANKA EXPORT DEVELOPMENT BOARD
## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
## இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை
## කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# IPM ESSEN 2027 ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපය

## 2027 ජනවාරි 26 සිට 29 දක්වා - එසන්, ජර්මනිය

2027 ජනවාරි 26 සිට 29 දක්වා ජර්මනියේ එසන් හි Messe Essen, Messepkatz පරිශ්‍රයේදී පැවැත්වීමට නියමිත IPM ESSEN 2027 ජාත්‍යන්තර මල් වගා හා උද්‍යාන අලංකරණ වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ වෙළඳ මණ්ඩපයක් සංවිධානය කිරීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය කටයුතු සූදානම් කර ඇත.

IPM ESSEN 2027 ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය යුරෝපා කලාපයේ විශාලතම මල්වගා හා උද්‍යාන අංකරණ වෙළඳ ප්‍රදර්ශනය ලෙස සැලකෙන අතර, මල්වගා සහ කොහු හා කොහු ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදකයින්, සකසන්නන් සහ අපනයනකරුවන්ට ව්‍යාපාරික සබඳතා ගොඩනගා ගැනීමටත්, නව තාක්ෂණය හා දැනුම හුවමාරු කර ගැනීමටත් මෙය ප්‍රමුඛ කේන්ද්‍රස්ථානයක් වේ. ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපයක් සංවිධානය කිරීමේ අරමුණ වන්නේ මල්වගා සහ කොහු ආශ්‍රිත නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම මෙන්ම යුරෝපීය කලාපයේ වෙළඳපල නව ප්‍රවණතා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ශ්‍රී ලංකික සමාගම්වලට අවස්ථාව සැලසීමයි.

**අයදුම් කළ හැක්කේ කා හටද?**

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ජාත්‍යන්තර වෙළඳපොළට සැපයීමේ හැකියාව ඇති, පහත සඳහන් නිෂ්පාදන කාණ්ඩවල ශ්‍රී ලංකාවේ මල්වගා සහ කොහු හා කොහු ආශ්‍රිත නිෂ්පාදකයින්, සකසන්නන් හා අපනයනකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ:

- විසිතුරු පත්‍රික ශාක වර්ග (Cut Foliage)
- බඳුන්ගත පැළ (Rooted Plants)
- පටක රෝපිත පැළ (Tissue Culture Products)
- මල්වගා සඳහා බීජ වර්ග (Floriculture Seeds)
- ජලජ පැළෑටි (Aquatic Plants)
- කොහු සහ කොහු ආශ්‍රිත නිෂ්පාදන (Coir and Coir-Based Products)
- උද්‍යාන අලංකරණ සේවා සහ සජීවී ශාකමය අමුද්‍රව්‍යවලින් ලබන සැරසිලි (Gardening Services and Outdoor Decorations)

**සහභාගීත්ව පිරිවැය**

ඉඩකඩ සහ කුටි ඉදි කිරීම් සඳහා වන පිරිවැය සහ ඊට අදාළ සියලු වියදම් සහභාගී වන සමාගම් විසින් දැරිය යුතුය. ප්‍රතිපාදන ලබා ගැනීමේ හැකියාව මත, තෝරාගත් සුළු හා මධ්‍ය පරිමාණ (SME) සමාගම් සඳහා ඉඩකඩ/ඉදිකිරීම් පිරිවැයෙන් කොටසක් සඳහා මූල්‍ය ආධාර ලබා දීමට අපනයන සංවර්ධන මණ්ඩලය සලකා බලයි.

**අයදුම් කරන ආකාරය සහ තෝරා ගැනීම**

අයදුම්පත්, EDB නිල වෙබ් අඩවිය වන **www.srilankabusiness.com** (“Announcements” කොටස යටතේ) වෙතින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රය මගින් ඉදිරිපත් කළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, කවරයේ ඉහළ වම් කෙළවරේ “**IPM ESSEN 2027**” ලෙස සඳහන් කර 2026 අගෝස්තු 25 වන දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් “අධ්‍යක්ෂ – අපනයන කෘෂිකර්ම, අපනයන සංවර්ධන මණ්ඩලය” වෙත ලැබීමට සැලැස්විය යුතුය. මෙම වැඩසටහන සඳහා සුදුසු සහභාගීවන්නන් තේරීම සඳහා EDB මගින් පත් කරන ලද කමිටුවක් විසින් සම්මුඛ පරීක්ෂණයට ලක් කරනු ඇත.

වැඩි විස්තර සඳහා ගයාන් වීරසිංහ – සහකාර අධ්‍යක්ෂ **011-2300732, 071-6569182** විද්‍යුත් තැපැල: **gayanw@edb.gov.lk** මගින් සම්බන්ධ කරගත හැක.

**සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**NDB / EDB කුළුන, 42, නවම් මාවත, කොළඹ 02.**
**වෙබ් අඩවිය : www.srilankabusiness.com**